## හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව
## 2019.12.18

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම ගරු සභාපති හා හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ නාමල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2019.12.18 වන දින ප.ව. 3.00ට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදි.

ප්‍රථමයෙන්ම, රැස්වීමට සහභාගී වූ ගරු සභාපතිතුමන් ප්‍රමුඛ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, දකුණු පළාත් සභාවේ ගරු සභාපතිතුමන්, පළාත් පාලන ආයතනවල ගරු සභාපතිතුමන්ලා ඇතුළු පැමිණ සිටි දේශපාලන නායකත්වය, සියළුම රාජ්‍ය හා අනෙකුත් ආයතනවල නිලධාරීන් ද ඇතුළුව පැමිණ සිටි සියළුම දෙනා දිස්ත්‍රික් ලේකම් විසින් පිළිගන්නා ලද අතර, පවතින ඕනෑම රජයක් යටතේ තමන් වෙත පැවරෙන වගකීම් නිසි පරිදි ඉටු කරමින් මහජනතාවගෙන් වැටුප් ලබන පිරිසක් වශයෙන් වඩාත් සතුටුදායී මහජන සේවාවක් ජනතාව වෙනුවෙන් සැපයීමට රජයේ නිලධාරීන් බැඳී සිටින බවත්, ඒ සඳහා අවශ්‍ය සහයෝගය දේශපාලන අධිකාරිය විසින් රාජ්‍ය නිලධාරීන් වෙත නිරතුරුව ලබා දිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි.
2019.07.22 දිනැති රැස්වීම් වාර්තාවේ අඩුපාඩු කිසිවක් නොවූ බැවින් එම වාර්තාව සභාසම්මත කරන ලදි. ඉන් අනතුරුව සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| **01** | **2019.07.22 රැස්වීමේ දී ගනු ලැබූ තීරණවල ප්‍රගතිය** | | | | |
| 1.1 | ඉඩම් | වීරකැටිය පස්මං හංදිය සංවර්ධනය කිරීමේ දී පවරා ගත් ඉඩම් සඳහා වන්දි ගෙවීම | මේ වන විට ඉඩම් කට්ටි 08 ක් පමණක් වන්දි ගෙවා අවසන් කර ඇති බවත්, තක්සේරු වාර්තා ලබා දීම ප්‍රමාද වන බවත් වීරකැටිය ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රකාශ කරන ලදි.<br>දිස්ත්‍රික්කය සඳහාම තක්සේරු නිලධාරීන් 06ක් වැනි සුළු ප්‍රමාණයක් පමණක් සිටින බැවින් ප්‍රමාදයන් සිදු වන බවත්, ඉදිරිපත් වී ඇති අනෙකුත් ඉඩම් කට්ටිවල ගැටළු නොමැති නම් සති දෙකක කාලයක් ඇතුළත වාර්තා ලබා දීමට හැකි බවත් තක්සේරුකරු විසින් ප්‍රකාශ කරන ලදි. | ඉඩම් පවරාගෙන වසර ගණනාවක් ගත වුව ද මේ වන තෙක් වන්දි ගෙවා අවසන් නොවීම තුළ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් මහ ජනතාව අප්‍රසාදයට පත් වන බැවින් අදාල වන්දි ගෙවීම් කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - වීරකැටිය / දිස්ත්‍රික් තක්සේරුකරු - හම්බන්තොට |
| 1.2 | වරි මාර්ග | ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද මැඩිල්ල පාලමේ විකල්ප මාර්ගය ඉවත් කිරීමේ දී මතු වී ඇති ගැටළු | මේ සඳහා ආසන්නයේ ඇති ඉඩමකින් කොටසක් පවරා ගැනීම සඳහා අදාල තක්සේරු වාර්තා ලැබී නොමැති බව වාර්තා විය. | අදාල තක්සේරු වාර්තා කඩිනමින් ලබා දීමට කටයුතු කරන ලෙසත්, ඉදිරි කටයුතු කඩිනම් කරන ලෙසත් දන්වන ලදි. | දිස්ත්‍රික් තක්සේරුකරු - හම්බන්තොට / ගරු සභාපති - තංගල්ල ප්‍රාදේශීය සභාව |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 1.3 | ගමනාගමන | කිරින්ද සිට හම්බන්තොට පරිපාලන සංකීර්ණය දක්වා නිලධාරීන් ගමන් කරන බස්රථය සම්බන්ධ ගැටළු | පරිපාලන සංකීර්ණයේ විවිධ ආයතනවල සේවය කරන නිලධාරීන් තම පහසුව සඳහා යම් මුදලක් ගෙවා වෙනම ප්‍රවාහන සේවයක් භාවිතා කරමින් කාර්යාලවලට පැමිණෙන බවත් ඒ සඳහා අවස්ථාව ලබා දිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි.<br>වෙනම කාර්යාල සේවාවක් සඳහා බලපත්‍ර ලබා දීමේ හැකියාවක් නොමැති බව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් ප්‍රකාශ කරන ලදි. | එම බස් රථයේ ගමන් කරන නිලධාරීන් සඳහා අවසර පත්‍රයක් ලබා දීම හා බස් හිමිකරුගේ ගාස්තුව එකවර ගෙවීමට කටයුතු කළ යුතු බවටත් තීරණය විය. අවසර පත්‍රයක් ලබාගෙන ඇති නිලධාරීන් පමණක් ප්‍රවාහනය කිරීම සිදුවන්නේ ද යන්න පරීක්ෂා කර බලන ලෙස උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට / මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය |
| 1.4 | ඉඩම් | හම්බන්තොට නව රෝහල සංවර්ධනයෙන් පසු ව්‍යාපාර අහිමි වූවන් සඳහා විකල්ප ඉඩම් ලබා දීම. | මේ වන විට ව්‍යාපාර අහිමි වූ ප්‍රජාව හම්බන්තොට නව රෝහල ආසන්නයේ මාර්ග දෙපස තාවකාලික කඩ සාදාගෙන වෙළඳාම් කටයුතු සිදු කරන බවත් ඒසඳහා විධිමත් විසඳුමක් ලබා දිම අත්‍යාවශ්‍ය බවත් ප්‍රකාශ කරන ලදි. | හම්බන්තොට නව නගර සැලැස්මට අනුව කටයුතු කිරීම සුදුසු බැවින් දේශපාලන අධිකාරිය සහ අදාල සියළු රාජ්‍ය නිලධාරීන් කැඳවා වෙනම සාකච්ඡාවක් පවත්වා ඉදිරි කටයුතු කිරීමට තීරණය විය. | නාගරික සංවර්ධන අධිකාරිය / නාගරික කොමසාරිස් |
| **2019.12.18 රැස්වීමේ දී සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ** | | | | | |
| **02** | **සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය ඉදිරිපත් කිරීම** | | | | |
| 2.1 | සංවර්ධන ව්‍යාපෘති | 2019 වර්ෂයේ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක ව්‍යාපෘතවල ප්‍රගතිය | විමධ්‍යගත අයවැය වැඩසටහන, ගම්පෙරළිය කඩිනම් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන, ධීවර අමාත්‍යාංශයේ ව්‍යාපෘති, ජනාවාස ආශ්‍රිත ප්‍රවේශ මාර්ග වැඩිදියුණු කිරීමේ වැඩසටහන හා සුඛිත පුරවර වැඩසටහන යටතේ රු.මි.1984.97 ක ප්‍රතිපාදන අනුමත වී ඇති බවත්, මේ වන විට 90%ක් පමණ වැඩ අවසන් වී ඇති බවත් වාර්තා කරන ලදි. පැවති අධික වර්ෂා කාලගුණික තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘති 3ක් 2020 වසර සඳහා අවිච්ඡේද කිරීමට සිදු වී ඇති බවත් වාර්තා විය. තව ද, රු.මි. 872.61ක ප්‍රමාණයක වියදමක් මේ වන විට සිදු | වර්ෂාව හේතුවෙන් අවිච්ඡේද වන ව්‍යාපෘති සඳහා අවශ්‍ය ප්‍රතිපාදන 2020 වසරේදී ලබා දීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලද අතර ඉතිරි වී ඇති කටයුතු කඩිනමින් නිම කරන ලෙස උපදෙස් ලබා දුනි. අවශ්‍ය අක්මුදල් ප්‍රමාණය දන්වා මහා භාණ්ඩාගාරයෙන් විශේෂ ඉල්ලීමක් කරන ලෙස දන්වන ලදි. | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| | | | කර ඇති අතර අක්මුදල් නොමැති නිසා බිල්පත් ගෙවීමට නොහැකිව පවතින බවත්, මෙම වසරේ ගෙවීම් කිරීම සඳහා රු.මි. 905.82ක අක් මුදල් අවශ්‍යතාවයක් ඇති බවත් දන්වන ලදි. | | |
| 2.2 | සංවර්ධන ව්‍යාපෘති | "සපිරි ගමක්" ප්‍රජාපාදක ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2020 | "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව, හුදකලා වූ ගම නගරය හා සම්බන්ධ කිරීමත්, ප්‍රතිග්‍රාමකරණය හරහා ගම ඉහලට ව්‍යාප්ත කිරීම තුළින් මුළු රටම තනි ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමෙන් පහසුකම් සපිරි ජීවන මධ්‍යස්ථානයක් බවට ගම පත්කිරීමේ අරමුණ අනුව, මෙම වැඩසටහන සඳහා සංවර්ධන ව්‍යාපෘති හඳුනාගත යුතු බවත්, එක් ග්‍රාම සේවා වසමක් සඳහා රු.මි. 2.00 ක් වෙන් වන බවත් දන්වන ලදි. මේ සඳහා අදාල චක්‍රලේඛය මේ වන විටත් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලබා දී ඇති බැවින් යෝජනා ලබා දීම කඩිනම් කිරීමට ඉල්ලා සිටින ලදි. | යෝජනා සඳහා අවශ්‍ය වුවහොත් සංශෝධනයන්ට යටත්ව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට |
| 2.3 | පොදු | කවශිමා කොම්පෝස්ට් ව්‍යාපෘතියේ ප්‍රගතිය ඉදිරිපත්කිරීම | 2018 ජුනි මාසයේ මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ඇති බවත්, කොන්ත්‍රාත් කාලය මාස තුනක් වුව ද මේ වන තෙක් වැඩ අවසන් කර නොමැති බවත් හම්බන්තොට ගරු නගරාධිපති විසින් ප්‍රකාශ කරන ලදි.<br>රෙඩි මේඩ් කොන්ක්‍රීට් නොතිබීම හේතුවෙන් ඒවා සපයාගැනීමට කාලයක් ගත වීම සහ එහි සැකිල්ල (Structure) ජපන් සැලසුමක් වන බැවින් ක්‍රියාත්මක කිරීමේ දී අධික මුදලක් හා කාලයක් ගත වන නිසා එම සැකිල්ල වෙනස් කිරීමට ද සිදු වීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වූ බවත්, 2020 ජනවාරි මස 20 වන දින වන | කොන්ත්‍රාත් ලබා ගැනීමේදී අමු ද්‍රව්‍ය සපයාගැනීම සම්බන්ධයෙන් සැලකිළිමත් විය යුතු බවටත්,මේ වන විටත් ඉදිකිරීම් බොහෝ ප්‍රමාද වී ඇති බැවින් ජනවාරි මස 20 වැනි දින වන විට ව්‍යාපෘතියේ වැඩ අවසන් කර මහනගර සභාව වෙත පවරා දිය යුතු බවටත් උපදෙස් ලබා දුනි. | කවශිමා කොම්පෝස්ට් ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් කරු / නාගරික කොමසාරිස් - හම්බන්තොට නගර සභාව |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| | | | විට සියළු වැඩ අවසන් කර භාරදීමට හැකි බවත් කොන්ත්‍රාත්කරු විසින් ප්‍රකාශ කරන ලදි. | | |
| 2.4 | ජල සම්පාදන | යෝජිත මිද්දෙනිය - අගුණකොළපැලැස්ස ජල යෝජනා ක්‍රමය පිළිබඳව දැනුවත් කිරීම | ව්‍යාපෘතිය සැලසුම් කිරීමේ දී ප්‍රදේශයේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් දැනුවත් විය යුතු බැවින් අවශ්‍ය ධාරිතාවයන් තීරණය කිරීම සම්බන්ධයෙන් ගැටළුවක් පවතින බවත්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් ප්‍රදේශයේ බොහෝ ජල ගැටළුවලට විසඳුම් ලබාගත හැකි බවත් ජල සම්පාදන මණ්ඩලය විසින් ප්‍රකාශ කරන ලදි. | 2020 ජනවාරි මාසයේ පළමු සතියේ නාගරික සංවර්ධන අධිකාරිය, ප්‍රාදේශීය ලේකම්, පළාත් සභාව ඇතුළු අනෙකුත් අදාල ආයතන සමඟ සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය / කළමනාකරු - ජාතික ජල සම්පාදන මණ්ඩලය / ගරු සභාපති - ප්‍රාදේශීය සභාව - අම්බලන්තොට, අඟුණකොළපැලැස්ස |
| **03** | **ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලින් ඉදිරිපත් වී ඇති ගැටළු** | | | | |
| 3.1 | ප්‍රවාහන | වලස්මුල්ල යද්දෙහිගොඩ - වරාපිටිය ගම් යා කර කිරම ඔය හරහා ගමන් කිරීම සඳහා ඇති අනාරක්ෂිත පාරුව වෙනුවට නව පාරුවක් ලබා දීම | පවුල් 30ක් පමණ ජීවත්වන මෙම ප්‍රදේශයේ ජනතාව ගමනාගමන පහසුකම් සපයාගනු ලබන මෙම පාරුව වසර 05ක පමණ කාලයක සිට අබලන් තත්ත්වයේ පවතින බව වාර්තා විය. | නව පාරුවක් ලබා දීම සඳහා අවශ්‍ය වන ඇස්තමේන්තුවක් කඩිනමින් ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - වලස්මුල්ල |
| 3.2 | මාර්ග සංවර්ධන | අත්තනයාල පාලම පිළිසකර කිරීම | පැවති අධික වර්ෂාව හේතුවෙන් මෙම පාලම සම්පූර්ණයෙන් ම කඩා වැටී ඇති බවත්, තාවකාලික විසඳුමක් ලෙස ලයිට් කණු යොදා පිළිසකර කර ඇති බවත් තවත් ලයිට් කණු කිහිපයක් අවශ්‍ය බවත් දන්වන ලදි. | ලයිට් කණු යොදා පිළිසකර කිරීම තවත් අනතුරුදායක වන බැවින්, කඩිනමින් පාලම පිළිසකර කිරීමට කටයුතු කරන ලෙස උපදේස් ලබා දුනි. | දිස්ත්‍රික් ඉංජිනේරු - මාර්ග සංවර්ධන අධිකරිය |
| 3.3 | මාර්ග සංවර්ධන | දබරැල්ල බෝක්කුව සහ තලම්පෝරුව සපත්තු පාලම අසල කොන්ක්‍රීට් පාර පිළිසකර කිරීම | මෙම මාර්ග සහ බෝක්කු අබලන් තත්ත්වයේ පවතින බැවින් මහජනතාව මහත් අපහසුතාවයට පත් වී ඇති බව වාර්තා විය. | අබලන් වී ඇති මාර්ග හා බෝක්කු සංවර්ධනය කිරීම සඳහා ලබන වසරේ ප්‍රතිපාදන වෙන් කර ගත හැකි බැවින් ඒ පිළිබඳ සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | සියළුම ප්‍රාදේශීය සභා සභාපතිවරුන් |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| **04** | **පළාත් පාලන ආයතනවලින් ඉදිරිපත් වී ඇති ගැටළු** | | | | |
| 4.1 | පොදු | අධිවේගී මාර්ග ව්‍යාපෘතිය හේතුවෙන් ජනතාව මුහුණ දෙන ගැටළු | හකුරුවෙල ගුවන් පාලම අසල ඉඩම් පවරා ගැනීමේ දී ඇතැම් ඉඩම් ප්‍රවේශ මාර්ග සහිතව කොටසක් පවරා ගැනීම හේතුවෙන් ව්‍යාපාර අකර්මන්‍ය වී ඇති බවත්, නිවාසවලින් අඩක් කැඩී ගිය අවස්ථාවලදී නිවසේ අඩකට පමණක් තක්සේරු කරමින් වන්දි ලබා දී ඇති බවත් වානිජ්‍ය ගොඩනැගිල්ලක ඉදිරිපස කැඩීමේ දී එම ගොඩනැගිල්ල භාවිතයට ගැනීමට නොහැකි අවස්ථාවල මෙම වන්දි ක්‍රමය සාධාරණ නොවන බවට ද අදහස් ඉදිරිපත් විය. | නිවාසවලින් අඩක් කැඩී යන අවස්ථාවලදී එම නිවාස නැවත භාවිතා කිරීමේ හැකියාවක් නොමැති බැවින් මුළු නිවසටම සහ පවරාගන්නා ලද ඉඩම් කොටස් සඳහා වන්දි ලබා දීමට කටයුතු කිරීම සුදුසු බවට තීරණය විය. තව ද පවරා ගැනීමෙන් පසු ඉතිරිවන ඉඩම් සඳහා ප්‍රවේශ මාර්ග අහිමි වීම හා වෙනස් වීම හේතුවෙන් සිදුවන හානිය පිළිබඳව නිසි තක්සේරුවක් කළ යුතු අතර, ව්‍යාපාරික ස්ථාන අහිමි වීම සහ අකර්මන්‍ය වීම පිළිබඳව ද නිසි තක්සේරුවක් කර වන්දි ලබා දීම සුදුසු බැවින් ඒ බව මාර්ග සංවර්ධන අධිකාරියට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු තීරණයක් ලෙස දන්වා යැවීමට තීරණය විය. | ප්‍රාදේශීය ලේකම් - අඟුණකොළපැලැස්ස / ගරු සභාපති - අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව |
| 4.2 | පොදු | අඟුණකොළපැලැස්ස නගරයේ අනවසර ඉදිකිරීම් හේතුවෙන් මතු වී ඇති ගැටළු | පැවති හම්බන්තොට දිස්ත්‍රික් සම්න්ධීකරණ කමිටු තීරණයකට අනුව අඟුණකොළපැලැස්ස රෝහල පිටුපස ඉඩම් කොටස රථ ගාලක් සඳහා ප්‍රාදේශීය සභාව වෙත පවරා දෙන ලෙස කරන ලද ඉල්ලීම ප්‍රධාන කාර්යාලය වෙත යොමු කරන ලද අතර, වානිජ වටිනාකමක් සහිත මෙම බිම් කොටස 1997 වර්ෂයේ නගර සැළැස්ම යටතේ කඩකාමර 10ක් සඳහා සැලසුම් කර ඇති බවත්, ඉන් බිම් කැබැල්ලක් නිලාන් චමින්ද යන අයට බැහැර කර ඇති බවත්, තවත් කොටසක් වාර්ෂික බදු ගෙවමින් පවතින බවත් අනාවරණය වූ බව මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් ප්‍රකාශ කරන ලදි. | එම ඉඩම් කට්ටි දෙක අතහැර ඉතිරි කොටස රථ ගාල සඳහා ලබා දෙන ලෙස මහවැලි අමාත්‍යතුමා වෙතින් නැවත ඉල්ලීම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | නොවාසික ව්‍යාපාර කළමනාකරු - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 4.3 | මාර්ග | අම්බලන්තොට පුහුල් යාය වලවවත්ත මාර්ගයේ පාලම පිලිසකර කිරීම | පසුගිය වර්ෂයේ මෙම පාලම කැඩී ගොස් ඇති අතර, අදාල ඇස්තමේන්තුව ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත්කර ඇති බව වාර්තා විය. | මේ පිළිබඳව සොයා බලා කඩිනමින් අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | ගරු සභාපති - අම්බලන් තොට ප්‍රාදේශීය සභාව / ආපදා කළමනාකරණ අංශය |
| 4.4 | පොදු | බරවකුඹුක බස් නැවතුම්පල සංවර්ධනය කිරීම | අධිවේගී මාර්ග සංවර්ධනයත් සමඟ බරවකුඹුක බස් නැවතුම්පල සංවර්ධනය කිරීම අවශ්‍ය බවත් බරවකුඹුක නගර සැලසුම් සැලැස්මට එය ඇතුළත් කර ඇති බවත් වාර්තා විය. | එම සැලැස්ම අනුව කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | නාගරික සංවර්ධන අධිකාරිය / ගරු සභාපති - අම්බලන් තොට ප්‍රාදේශීය සභාව |
| **05** | **විශේෂ යෝජනා** | | | | |
| 5.1 | මාර්ග | හම්බන්තොට නව දිස්ත්‍රික් මහ රෝහල අසල මාර්ගයේ සංඥා පද්ධති සකස් කිරීම හා විදුලි පහන් සවිකිරීම | නව රෝහල ආරම්භ කිරීමත් සමඟ ඒ අසල මාර්ගයේ බස් නැවතුම් ඇතුළු අනෙකුත් පහසුකම් සංවර්ධනය නොවීම හේතුවෙන් මහජනතාව අපහසුතාවයට පත් වී ඇති බව වාර්තා විය. | රෝහල් චතුරශ්‍රය සංවර්ධනය වීමත් සමග මාර්ග සැලැස්ම වෙනස් වන බැවින් ස්ථිර බස් නැවතුම් එම මාර්ගයේ ඉදි නොකරන ලෙස උපදෙස් ලබා දුන් අතර, සෞඛ්‍ය අමාත්‍යතුමියගේ ප්‍රධානත්වයෙන් 2019.12.19 වන දින පැවැත්වෙන රැස්වීම සඳහා සියළු පාර්ශව සහභාගී වන ලෙසත්, එහිදී සියළු ගැටළු ඉදිරිපත් කරනලෙසත් උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් ඉංජිනේරු - මාර්ග සංවර්ධන අධිකාරිය / නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය අධ්‍යක්ෂ - හම්බන්තොට මහ රෝහල |
| 5.2 | වාරි මාර්ග | ඌරණිය වැව හම්බු පැලැටි හේතුවෙන් අවහිර වීම | දේශගුණික සුහුරු ව්‍යාපෘතිය මඟින් මෙම වැව සංවර්ධනය කිරීමට කටයුතු යොදා ඇති බවත්, මේ වන විට සැලසුම් සකස්කරමින් පවතින බවත් වාර්තා විය. | විශේෂ ගැටළු සංශෝධනයට යටත්ව අනුමැතිය ලබා දිය හැකි බව ප්‍රකාශ කරන ලද අතර, කඩිනමින් ඉදිරි කටයුතු සිදු කරන ලෙසත්, වැව් ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධ සාකච්ඡාවක් ඉදිරියේ දී පැවැත්වීමට නියමිත බැවින් සියළු ගැටළු ඒ සඳහා ඉදිරිපත් කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | ව්‍යාපෘති අධ්‍යක්ෂ - දේශගුණික සුහුරු ව්‍යාපෘතිය |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| **06** | **දේශපාලන නායකත්වයෙන් ඉදිරිපත් වී ඇති ගැටළු** | | | | |
| **6.1** | **හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ නාමල් රාජපක්ෂ මැතිතුමා** | | | | |
| 6.1.1 | ජල සම්පාදන | උස්වැව ගමට පානීය ජලය ලබාගැනීම | දැනට ජල සම්පාදන ව්‍යාපෘතියක් මෙම ගමට නොමැති බවත්, මිද්දෙනිය - අඟුණකොලපැලැස්ස ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුවහොත් එම ප්‍රදේශය ආවරණය වන බවත් වාර්තා විය. | පදලංගල ජල ව්‍යාපෘතියෙන් මෙම ප්‍රදේශයට ජලය ලබා දීමට ඇති හැකියාව සම්බන්ධයෙන් සොයා බලා එම කටයුතු කඩිනම් කරන ලෙසත්, ඒ පිළිබඳ වාර්තාවක් මීළඟ කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | කළමනාකරු - ජල සම්පාදන මණ්ඩලය |
| 6.1.2 | ඉඩම් | සූරියවැව මිරිජ්ජවිල අඩි 100 මාර්ගයේ ඉඩම් අහිමි වූවන් සඳහා වන්දි ලබා දීම | ඉඩම් පවරාගෙන වසර ගණනක් ගත වුව ද මේ වන තෙක් ඉඩම් අහිමි වූවන් සඳහා වන්දි ගෙවීම් කටයුතු අවසන් වී නොමැති බැවින් ඔවුන් අපහසුතාවයන්ට පත් වී ඇති බව වාර්තා විය. | මේ පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට / සූරියවැව / ප්‍රාදේශීය කළමනාකරු - මාර්ග සංවර්ධන අධිකාරිය |
| **6.2** | **හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී දිලිප් වෙද ආරච්චි මැතිතුමා** | | | | |
| 6.2.1 | රැකියා | ආර්ථික කටයුතු අමාත්‍යාංශය, සමෘද්ධි බැංකුව හා නිවාස සංවර්ධන අධිකාරියට අනුයුතක්ත සේවකයන්ගේ පත්වීම් ස්ථිර කිරීම | මෙම පත්වීම් කැබිනට් පත්‍රිකාවකින් අනුමත කර ඇති බවත්, දින 180කින් පසු පත්වීම් ලබාදිය හැකි බැවින් දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන් හට එම රැකියා අවස්ථා ලබා දීමට යෝජනා කරන ලදි. | සේවකයන් විශාල ප්‍රමාණයකට වැටුප් ගෙවීමේ ප්‍රායෝගික ගැටළුවක් පවතින බවත්, ඒ පිළිබඳව සොයා බලා මානුෂිකව කටයුතු කරන බවටත් ප්‍රකාශ කරන ලදි. | සාමාන්‍යාධිකාරී - නිවාස සංවර්ධන අධිකාරිය |
| 6.2.2 | පොදු | 1818 කැරැල්ලේ දී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් රාජද්‍රෝහීන් ලෙස නම් කර ඝාතනය කරන ලද විරුවන් දේශප්‍රේමීන් ලෙස නම් කිරීම | හම්බන්තොට දිස්ත්‍රික්කයේ විරුවන් පස් දෙනෙකු එසේ රාජද්‍රෝහීන් ලෙස නම් කර ඝාතනය කර ඇති බවත්, ඔවුන් දේශප්‍රේමීන් ලෙස නම් කර ගැසට් නිවේදනයක් නිකුත් කිරීම සුදුසු බවත් යෝජනා කරන ලදි. | එම කටයතු කඩිනමින් සිදු කිරීම සුදුසු බවට තීරණය කරන ලදි. | දිස්ත්‍රික් සංස්කෘතික නිලධාරී - හම්බන්තොට |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 6.2.3 | ඉඩම් | බටඅත දකුණ කොරියානු අධාර යටතේ ඉදිකරන ලද නිවාසවලින් 18ක් අනවසරයෙන් අල්ලා ගැනීම | මෙම අනවසර පදිංචිකරුවන් නිවාස අහිමි පිරිස් වන බැවින් ජලය හා විදුලිය එම නිවාස සඳහා ලබා දී නොමැති බවත්, මේ සම්බන්ධයෙන් පළාත් ඉඩම් කොමසාරිස් විසින් මූලික පරීක්ෂණ සිදුකර ඇති බවත් වාර්තා විය. | ඉඩම් කච්චේරියක් පවත්වා මේ සම්බන්ධ වාර්තාවක් ලබා දෙන ලෙස උපදෙස් ලබාදුනි. | ප්‍රාදේශීය ලේකම් - |
| **07** | වෙනත් ගැටළු | | | | |
| 7.1 | ඉඩම් | පන්නෙගමුව සති පොල සංවර්ධනය කිරීම | රාජ්‍ය නිර්මාණ හා නීතිගත සංස්ථාව විසින් මෙහි ඉදිකිරීම් කටයුතු 2015 වර්ෂයේ සිට සිදුකරන බවත් මේ වන විට ගෙවීම් කිරීමට ප්‍රතිපාදන නොමැති බවත් වාර්තා විය. | මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට කාලයක් ගතවන බැවින් එම ගැටළු වෙනම සාකච්ඡා කිරීම සුදුසු බවට තීරණය විය. | ගරු සභාපති - තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව |
| 7.2 | ජල සම්පාදන | බරවකුඹුක ප්‍රදේශයේ ක්‍රියාත්මක වන ප්‍රජා ජල ව්‍යාපෘතිය යහපත් තත්ත්වයේ නොමැති බැවින් නෝනාගම ජල සම්පාදන ක්‍රමය බරවකුඹුක දක්වා දීර්ඝ කිරීම | නෝනගම ජල සම්පාදන ක්‍රමය බරවකුඹුක දක්වා දීර්ඝ කිරීමට දල ඇස්තමේන්තු මුදල රු.මි. 147ක් පමණ වන බවත් එම ප්‍රතිපාදන සපයා ගැනීම අපහසු බවත්, මිද්දෙනිය - අඟුණකොළපැලැස්ස ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් මෙම ප්‍රදේශය ද ආවරණය වන බවත් වාර්තා විය. | සකස් කරන ලද ඇස්තමේන්තුව අමාත්‍යාංශයට යොමු කරන ලෙසත්, දිස්ත්‍රික්කයේ සියළු ජල ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ගරු රාජ්‍ය ඇමතිතුමා දේශපාලන නායකත්වය සමඟ අදාල රාජ්‍ය නිලධාරීන් කැඳවා විශේෂ රැස්වීමක් පැවැත්වීම සුදුසු බවත් තීරණය කරන ලදි. | කළමනාකරු - ජල සම්පාදන මණ්ඩලය |
| 7.3 | මාර්ග සංවර්ධන | තිස්ස ප්‍රදේශයේ මාර්ග ජලයෙන් යට වීම | ගංවතුර තත්ත්වයන්වලදී බොරළු ඇතිරූ මාර්ග කැඩීයන බැවින් ABC ඇතිරීම සඳහා ප්‍රතිපාදන ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි. | අදාල ඇස්තමේන්තු සකස් කර ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි | ගරු සභාපති, ප්‍රාදේශීය සභාව - තිස්සමහාරාමය |
| 7.4 | පොදු | දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභී පවුල් නගා සිටුවීම | දිස්ත්‍රික් ක්‍රම සම්පාදන ලේකම් කාර්යාලය විසින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ සෞඛ්‍යාරක්ෂිත වැසිකිළි පහසුකම් නොමැති පවුල් පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්තාවක් සහ විශේෂ අවශ්‍යතා සහිත දිළිඳු පවුල් පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්තාවක් සකස් කර ඇති බවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත අභ්‍යාසලාභී උපාධිධාරීන් විසින් "සුවදිවි රැකුම" නමින් | ඉදිරියේ දී මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු කර කටයුතු කිරීමට තීරණය විය. | සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| | | | සමීක්ෂණ වාර්තාවක් සකස් කර ඇති බවත් ප්‍රදේශයේ ජනතාව නගා සිටුවීම සඳහා විවිධ වැඩසටහන් සම්පාදනය කිරීමේ දී මෙම වාර්තා උපයෝගී කර ගත හැකි බවට කරුණු ඉදිරිපත් විය. | | |
| 7.5 | පොදු | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ උප කාර්යාලයක් පරිපාලන සංකීර්ණයේ පිහිටුවීම | මෙම උප කාර්යාලය පිහිටුවීම මඟින් හම්බන්තොට, කතරගම, මොනරාගල, අම්පාර සහ රත්නපුර ප්‍රදේශවල ජනතාවට මහත් සේවාවක් ඉටුවන බවත්, පරිපාලන සංකීර්ණයේ ඉහල මාලයේ ඇති ඉඩ ප්‍රස්ථාව මේ සඳහා යොදාගත හැකි බවත් වාර්තා විය. | ඒ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා දුනි. | දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට |
| 7.6 | ජල සම්පාදන | තිස්සමහාරාම ප්‍රදේශයට පානීය ජලය සපයන ජලසම්පාදන ක්‍රමයෙන් මඩ වතුර ලැබීම | ජල මූලාශ්‍රයේ තිබූ ගැටළුවක් හේතුවෙන් බුන්දල සිරියාගම ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම මත මෙම ගැටළුව සඳහා විසඳුම් ලබා දීම ප්‍රමාද වූ බවත්, ඉදිරියේ දී එය නිවැරදි කළ හැකි බවත් වාර්තා විය. | එම කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. මේ සම්බන්ධයෙන් විශේෂ සාකච්ඡාවක් පැවැත්වීම සුදුසු බවට තීරණය කරන ලදි. | ගරු සභාපති - තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව / කළමනාකරු- ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය |
| 7.7 | ඉඩම් | පාරම්පරික ඉඩම් සඳහා තක්සේරු ලබා දීමේ දී මතු වී ඇති ගැටළු | තිස්සමහාරාම ප්‍රදේශයේ පාරම්පරික ඉඩම් සඳහා දීමනාපත්‍ර ලබා දීමේ දී වර්තමාන වටිනාකමට අනුව තක්සේරු කිරීම හේතුවෙන් ඉඩම් හිමියන්ට විශාල මුදලක් ගෙවීමට සිදු වී ඇති බවත් එම ගැටළුව දිස්ත්‍රික්කයේ තවත් බොහෝ ප්‍රදේශවල පවතින බවත් වාර්තා විය. | රජයේ ප්‍රමාද දෝෂය හේතුවෙන් දීමනා පත්‍ර ලබා දීම ප්‍රමාද වී ඇති බැවින් ඉඩම් පවරා ගත් කාලයේ ඉඩමේ වටිනාකම අනුව තක්සේරු ලබා දීම සුදුසු බවට තීරණය කිර ලදි. | ගරු සභාපති - තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව |

හම්බන්තොට වරාය, මත්තල ගුවන් තොටුපල, සූරියවැව තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය, හම්බන්තොට නව රෝහල ආදී මහාපරිමාන ව්‍යාපෘතිවලට සමගාමීව අඩු ආදායම්ලාභී පවුල්වල ආදායම් ඉහල දැමීම සඳහා රැකියා උත්පාදන අවස්ථා රාශියක් ආරම්භ කිරීමටත්, වෘත්තීය පුහුණු අවස්ථා ලබා දීමටත්, හරිත නගරයක් ලෙස හම්බන්තොට සංවර්ධනය කිරීම සඳහා ගුවන් පාලම් හරිතකරණය සඳහා යොමු කිරීම (Vertical Garden) මාර්ග දෙපස පැල සිටුවීම, ගුවන් පාලම් සංවර්ධනයේ දී අලිමංකඩ නිදහස් කිරීම, කාබනික පොහොර නිෂ්පාදනය ව්‍යාප්ත කිරීම, විදුලි අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා සූර්ය පැනල (Solar power) භාවිතය ව්‍යාප්ත කිරීම සහ ආරක්ෂක අංශ යොදා ගනිමින් මත් ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන්ට ප්‍රතිකාර ලබා දීමේ මධ්‍යස්ථාන ව්‍යාප්ත කිරීම ආදී ව්‍යාපෘති රාශියක් 2020 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත බැවින්

ඒ සඳහා සියළු දෙනාගේ සහයෝගය ලබා දෙන ලෙසත්, රාජ්‍ය ආයතන වඩාත් කාර්යක්ෂම කරමින් මහජනතාවට වඩාත් සතුටුදායී සේවාවක් සැපයීමට සියළුම නිලධාරීන් කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිමින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් කමිටුවේ සියළුම සාමාජිකයන් වෙත ස්තූතිය පිරිනැමීමෙන් අනතුරුව ප.ව 6.30 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය.

සී.ඒ. සුනෙත් ලෝචන
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති (රාජකාරි ආවරණය)
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

සී.ඒ.සුනෙත් ලෝචන
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
රාජකාරී ආවරණ
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

2019 දෙසැම්බර් මස 30 දින
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.